

# ජලසම්පාදන අමාත්‍යාංශය

## ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, මිනිස්බල සංවර්ධන හා පුහුණුකිරීමේ අංශය මෙහෙයවන ජලනල කාර්මිකයින් සඳහා වෘත්තීය නිපුණතා නැවුම්කරණ පාඨමාලාව හැදෑරීමට ඔබටත් අවස්ථාවක්

වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන් ගී ආරම්භකර ඇති විවිධ නව සංවර්ධන ව්‍යාපෘතින් හා ගෘහස්ථ කටයතු සඳහා නුතන තාක්ෂණික දැනුමෙන් පිරිපුන් ජලනල කාර්මික ශිල්පින්ගේ අවශ්‍යතාවය ප්‍රධාන ස්ථානයක් ගිම්කර ගනී. ඒ අතරින් දැනට එම ක්ෂේත්‍රයන්හි සේවයේ නියුතු ජලනල කාර්මික ශිල්පින්ගේ නිපුණතාව වැඩි දියුණු කිරීම හා ඔවුන් ලියාපදිංචි කර දත්ත සමුදායක්(Database) සෑදීම අරමුණු කර පානීය ජලය සැපයුමේ ප්‍රධාන රාජ්‍ය ආයතනය වන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව ඒකාබද්ධව **ජලනල කාර්මිකයින් සඳහා වෘත්තීය නිපුණතා නැවුම්කරණ පාඨමාලාව** සැලසුම් කර ඇත. ඒ සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් 2021-01-18 දිනට පෙර පහත සඳහන් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල මගින් අයදුම්කල හැක.

### අවශ්‍ය සුදුසුකම්

- ඉල්ලුම්කරන දිනට වයස අවුරුදු 40 ට වඩා අඩුවිය යුතුය.
- ජලනල කාර්මික ක්ෂේත්‍රයේ ජාතික නිපුණතා මට්ටම (NVQ) 3 හෝ 4 මට්ටම සම්පූර්ණ කර තිබිය යුතුය.

### පුහුණුවන්නන් හට ලැබෙන ප්‍රතිලාභ

- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව එක්ව නිකුත් කරන වෘත්තීය සහතිකය.
- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ලියාපදිංචිය.
- පාඨමාලාව සාර්ථකව නිමකරන ජලනල කාර්මික ඔබගේ තොරතුරු ජංගම යෙදුමක් (Mobile App) මගින් ගෘහස්ථ හා කාර්මික පාරිභෝගිකයන් හට ඔවුන්ගේ සේවා අවශ්‍යතාව සපුරා ගැනීම සඳහා ඔබව සෘජුවම සම්බන්ධ කර ගැනීමට හැකි වීම.
- රජයේ සහ පෞද්ගලික අංශයේ ආයතන වල ඔබට නව රැකියා අවස්ථා සඳහා දොරටු විවර වීම.
- නොමිලේ ලබා දෙන උපකරණ කට්ටලය (Tool Kit) හා වැඩහල් ඇඳුම (Safety Uniform).

### අයදුම්පත් ලබාගත හැකි ආකාරය

- තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) නාරාහේන්පිට පිහිටි කාර්යාලය මගින්.
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ (NAITA) හෝ වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) ප්‍රධාන කාර්යාල හා ප්‍රාදේශීය පුහුණු මධ්‍යස්ථාන මගින්.
- ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ, රත්මලාන, තෙලවල පාරේ පිහිටි, මිනිස්බල සංවර්ධන හා පුහුණුකිරීමේ අංශය මගින් හා වෙබ් අඩවිය මගින් බාගත කළ හැක (www.waterboard.lk).

### පුහුණු කාලය

- සති 3 යි

## පාඨමාලාව සඳහා ගාස්තු අය නොකෙරේ

සහකාර සාමාන්‍යාධිකාරී
මිනිස්බල සංවර්ධන හා පුහුණුකිරීමේ අංශය,
ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,
තෙලවල පාර, රත්මලාන.

විද්‍යුත් තැපැල - srilankaplumber@gmail.com

වැඩිදුර විස්තර සඳහා දුරකථන අංක - 011-2632355

**උසස් නිපුණතාව - සුරකියි නල ජලය**

තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිසම් සභාවේ ලියාපදිංචි අංකය - P01 / 0790